සබරගමු පළාත් අධ්‍යාපන  දෙපාර්තමේන්තුව

විෂය  : භූගෝල විද්‍යාව දෙවන වාර අවසාන පරීක්ෂණය

ශ්‍රේණිය: 6 ශ්‍රේණිය

සකස් කිරීම _ මාවනැල්ල කලාපය

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

- අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ නිවැරදි  පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

( ගිරවා, මීයා, ගැඩවිල් පණුවා, නිරිත, ඇටි කුකුළා, වයඹ)

1. බස්නාහිර හා දකුණු දිශාව අතර .......................... පිහිටා ඇත.
2. වගාවන්ට හානි කරන ගොළුබෙල්ලන් .......................... විසින් විනාශ කර දමයි.
3. පරිසරයට අලංකරණයක් .......................... එකතු කරයි.
4. මහාමාරිය රෝගය .......................... නිසා ඇති වේ.
5. පස සරු කිරීමට .......................... දායක වේ.

- අංක 06-10 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර යටින් ඉරක් අඳින්න.

6. බඩ ඉරිඟු බෝගය හොඳින් වගා කළ හැක්කේ,
   1. තෙත් කලාපයේය.
   2. වියළි කලාපයේය.
   3. කැළණි ගංගා මිටියාවතේය.
   4. වෙරළබඩ කලාපයේය.
7. පාරම්පරික ශිල්ප ඥානය පදනම් කරගෙන කරනු ලබන වෙස් මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයකි.
   1. රදාවඩුන්න  2. දුම්බර
   3. මොරටුව  4. අම්බලන්තොට
8. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂියෙකි.
   1. සුදු රෙදි හොරා  2. ඇටි කුකුළා
   3. ගිරවා  4. මයිනා
9. නිවැරදිව දිශාව හඳුනා ගැනීමට උපකාරී වේ.
   1. අනිලමානය  2.සුළං දිශා දර්ශකය
   3. මාලිමාව  4. බැරෝමීටරය
10. දුම්බර ප්‍රදේශයේ ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයටගෙන නිපදවයි.
   1. පැදුරු  2. වළං
   3. ලී බඩු  4. වෙස් මුහුණු

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් "නි" යන්න වටාද වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.

11. තට්ටු නිවාස වැඩි වශයෙන් නාගරික ප්‍රදේශවල දක්නට ලැබේ. ( නි / වැ )
12. අප ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන ජීව වායුව උත්පාදනය කළ හැකිය. ( නි / වැ )
13. යම්කිසි ස්ථානයක දිගු කාලීන වායුගෝලීය තත්ත්වය කාලගුණය නම් වේ. ( නි / වැ )
14. මදුරුවා ඩෙංගු රෝගය බෝ කරයි. ( නි / වැ )
15. මී මැස්සා ගොවිතැනට අහිතකර කෘමි සතෙකි. ( නි / වැ )

- අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු ශ්‍රී ලංකා සිතියම ඇසුරෙන් සපයන්න.



16. මොරටුව දැක්වෙන්නේ .................. අක්ෂරයෙනි.
17. රදාවඩුන්න .................. අක්ෂරයෙන් දැක්වේ.
18. පිළිමතලාව දැක්වෙන්නේ .................. අක්ෂරයෙනි.
19. දුම්බර .................. අක්ෂරයෙන් දැක්වේ.
20. අම්බලංගොඩ දැක්වෙන්නේ .................. අක්ෂරයෙනි.

# II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනිකුත් ප්‍රශ්න අතුරින් හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

A B



C D

1. I) මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද?

   II) ඒවා අයිති ආගම් හතර **A,B,C,D,** පිළිවෙළින් නම් කරන්න.

   **III)** එම ආගම් වලට අයත් උත්සව හතරක් පිළිවෙළින් නම් කරන්න.

   IV) ඔබේ පාසල අවට ඇති පූජනීය ස්ථාන තුනක් ලියා දක්වන්න.

   V) ඔබේ ප්‍රදේශයේ ජීවත්වන ජාතීන් හතරක් නම් කරන්න.

   VI)) ඔබේ ප්‍රදේශයේ එම ජාතීන් සහයෝගයෙන් පවත්වා ගෙන යන සංවිධානයක් නම් කරන්න.

2.

A

B

   I) **A.** අක්ෂරයෙන් දැක්වෙන නිවස පිහිටි පරිසරය කුමක්ද?

   **B.** අක්ෂරයෙන් දැක්වෙන නිවස පිහිටි පරිසරය කුමක්ද?

   II) ඔබ ඉගෙනගත් තවත් නිවාස ඉදිකරන වෙනත් පරිසර කලාප 4ක් ලියන්න.

   III) ඔබේ නිවස අවට ප්‍රදේශයේ පිහිටීමෙන් ඔබට ඇති වාසි තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

3. I) ඔබේ නිවස අවට සිටින සතුන් දෙදෙනෙක් ලියන්න.

   II) මී මැස්සා, මීයා, සමනළයා, මදුරුවා යන සතුන් මිනිසාට අහිතකර සතුන් ලෙස වෙන් කර දක්වන්න.

   III) අවට පරිසරයේ සිටින සතුන්ගෙන් අපට ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න.

4. I) ඔබේ ගෙවත්තේ වගාකර ඇති ශාක වර්ග දෙකක් ලියන්න.

   II) ඔබේ පාසල් වත්තේ ඇති ශාක වර්ග 4ක් නම් කරන්න.

   III) ශාකවලින් ඇති ප්‍රයෝජන 5ක් ලියන්න.

5. I) ශ්‍රී ලංකාවේ සිදු කරන කෘෂිකාර්මික කටයුතු 2ක් ලියන්න.

   II) පරිසරයේ මූලිකාංගයක් වන භූමියෙන් ගන්නා ප්‍රයෝජන 4ක් ලියන්න.

   III) A. භූමිය අවිධිමත් ලෙස පරිහරණය නිසා ඇති වන ප්‍රතිඵල 3ක් ලියන්න.

   **B.** විධිමත්ව පරිහරණය කිරීමට කළයුතු කාර්යයන් 2ක් ලියන්න.

6. I) වායු දූෂණය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල 2ක් ලියන්න.

II) ජලය හිඟවීමෙන් ඇතිවිය හැකි ගැටළු 4ක් ලියන්න.

III) ජලය තිරසාරව පවත්වා ගැනීම සඳහා ගතහැකි පියවර 5ක් ලිය න්න.

7. I) A. ඔබේ නිවසේ බල ශක්ති ප්‍රභවය නම් කරන්න.

B. එම බල ශක්ති ප්‍රභවය අපතේ යන අවස්ථාවක් ලියන්න.

II) බල ශක්ති ඉල්ලුම ඉහළයෑම බලපාන හේතු 4ක් ලියන්න.

III) ඔබේ නිවසේ බල ශක්තිය අඩුවෙන් පරිහරනය සඳහා ගතහැකි ක්‍රියා මාර්ග 5ක් ලියන්න.